## සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවූ අවස්ථා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| ගිණුම් ප්‍රමිතය | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ පමිත 16 | සමාලෝචිත වර්ෂය අවසානයට පාර්තෝෂික වෙන්කිරීම රු 17,282,147 ක් වුවත්, ප්‍රමිතයට අනුව බැරකම ආවරණය වන ලෙස රු 1,000,000 ක් පමණක් ආයෝජනය කිරීමට කටයුතු කර තිබුණි. |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 | ප්‍රමිතය ප්‍රකාරව පරිගණක ලේසර් ප්‍රින්ටර්,ෆැක්ස් යන්ත්‍ර, දුරකථන යනාදී වත්කම් ක්ෂය කිරීම් ප්‍රතිශතය ගණනය කිරීමේදී එම වත්කම් වල සුන්බුන් අගය හා ජීව කාලය සලකා බැලිය යුතු වුවත්, එසේ කර නොතිබුණි. |

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

අ) රු 8,525,406 ක් වටිනා කෙටි කාලීන ආයෝජන ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි.

ආ) සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා අරමුදල් යටතේ නිමකරන ලද කොන්ත්‍රාත් 10 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු 1,557,961 ක බැරකම් ගිණුම් ගත කර නොතිබුණි.

ඇ) ණයගැති ශේෂයෙන් 14% ක් වන රු 3,157,476 වන ණයගැති ශේෂය අයකර ගත නොහැකි ලෙස අධිකාරියෙ හඳුනාගෙන තිබියදීත් ඒ වෙනුවෙන් 3%ක වාර්ෂික බොල්ණය හා අඩමාන ණය ප්‍රතිපාදනයක් කිරීමේ ප්‍රමාණාත්මක භාවය පිළිබඳ විගණනයෙදී සෑහීමකට පත්විය නොහැකි විය.

ඇ) සමාලෝචිත වර්ෂයේදී නිම කරන ලද කොන්ත්‍රාත් 16 ක් වෙනුවෙන් ලැබිය යුතු රු 4,722,340 ක මුදල ගිණුම් ගත කර නොතිබුණි.

ඉ) සමාලෝචිත වර්ෂයේදී $ නගමු පුරවර $ වැඩසටහන යටතේ රේඛීය අමාත්‍යාංශයෙන් ලැබී තිබණු රු 1,500,000 ක මුදලින් රු 981,500 ක් පමණක් ශේෂ පත්‍රයේ දක්වා තිබුණු නමුත් ඉතිරි රු 518,500 ක මුදල ගිණම් වල පෙන්වා නොතිබුණි.

1.2.3 අඛණ්ඩ පැවැත්ම

අධිකාරියේ ශුද්ධ වත්කම් සමාලෝචිත වර්ෂයේ හා පසගිය වර්ෂ 02 ක පිළිවෙලින් රු 12,841,863, රු12,869,156 හා රු 6,124,654 ක් වශයෙන් සෘණ අගයක් ගන්නා අතර ජංගම අනුපාතය පිළිවෙලින් 1:2.5, 1:2.8, 1:1.7, ක් වන බැවින් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම ප්‍රශ්ණ කාර්වේ.

2003 වර්ෂයේ සිට අදාල පිරිවැය පියවා ගැනීම වෙනුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් උපයන ආදායම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් විවිධ ණයගැති ශේෂ අයකර වැටුප් ගෙවීම සඳහා යෙදවීමටත්, ණයහිමි ශේෂ නිරවුල් නොකර සිටීමටත් සිදුවූ බව හා මෙම තත්ත්වය ජංගම අනුපාතය අහිතකර තත්ත්වයකට පත්වීමට ප්‍රධාන හේතුව වශයෙන් බලපා ඇති බව අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

1.2.4 <u>පැහැදිලි නොකල වෙනස්කම්</u>

ජාතික නිවාස සංවර්ධන අධිකාරයෙන් ලැබිය යුතු රු 3,875,150 ක් වු සේවා දායක ණයගැති ශේෂයක් හා ගෙවිය යුතු රු 1,585,314 ක් වු සේවාදායක අත්තිකාරම් ජාතික නිවාස සංවර්ධන අධිකාරයේ ගණුම් අනුව පිළිවෙලින් රු 2,262,134 හා රු 20,984,863 ක් වු බැවින් වෙනස්කම් හදුනා ගෙන ගිණුම් වල අවශ්‍ය ගැලපීම් කිරීමට පියවර ගෙන නොතිබුණි.

1.2.5 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) වසර 05 කට වැඩි කලක සිට ඉදිරියට ගෙන එන රු 3,672,000 ක් ව සේවාදායක ණයගැතියන් 05 දෙනෙකු ගෙන් ලැබිය යුතු ණය අයකර ගැනීමටත් රු 25,636,653 ක් වු ණය හිමි ශේෂ 04 ක් නිරවුල් කිරීමටත් අධිකාරය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

ආ) වටිනාකම රු 12,667,999 ක ණයහිමි ශේෂ 03 කට හා රු 18,945,075 ක ණයගැති ශේෂ 02 කට අදාලව ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.2.6 <u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකුල නොවීම.</u>

පහත සඳහන් අනුකුල නොවීම් නිරීක්ෂණය විය.

| <u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| අ) මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මු.රෙ.104 | සමාලෝචිත වර්ෂය තුල මෝටර් වාහන වලට සිදුවු රු 164,738 ක් වටිනා අනතුරු සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| මු.රෙ.225 (1) | සෑම ගෙවීමක් සඳහාම වවුචර් විගණනයට ඉදිරිපත් කල යුතු වුවත් 2010 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල නිළධාරින්ට ගෙවා තිබු රු 1,177,209 ක නිවාඩු දින වැටුප් සඳහා වු ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| ආ) 1997 මැයි 03 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 11 8 (අ) | මාණ්ඩලික නිළධාරීන් සඳහා මාසයකට එක් දිනක් සඳහා පමණක් නිවාඩු දින වැටුප් ගෙවිය හැක වුවද, එයට අමතරවනිවාඩු දින එකක් වෙනුවෙන් රු 79,961 ක නිවාඩු දින වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. |
| ඇ) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 ඡේදය 2.2.1 (ආ) | වාර්ෂික වර්තා නියමිත කාල රාමුවක් තුල පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත්, අධිකාරිය විසින් වසර 2006 සිට 2009 දක්වා වූ වාර්ෂික වාර්තා මේ දක්වා සභාගත කර නොතිබුණි. |

## 2 <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ ශුද්ධ ලාභය රු 27,293 ක් වූ අතර ඊට ප්‍රතිරූපී ඉකුත් වර්ෂයේ ශුද්ධ අලාභය රු16,768,236 ක් විය. නැවත නොගෙවිය යුතු යැයි හඳුනාගත් රු 1,261,729 ක් වූ ණයහිමි ශේෂ හා රු 484,103 ක උපචිත කරන ලද වැඩිපුර ප්‍රතිපාදන, ආදායම් ලෙස ගිණුම් ගතකිරීම සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභයට හේතුවී තිබුණි.

### 2.2 <u>මෙහෙයුම් සමාලෝචනය</u>

#### 2.2.1 <u>කාර්‍ය්‍යය සාධනය</u>

අ) 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතේ 5 (ඉ) වගන්තියට අනුව, සහාධිපත්‍ය දේපල කළමනාකරණ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම කළයුතු වුවද, සමාලෝචිත වසර තුල සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම් 66 ක් වූ අතර එම සහාධිපත්‍ය දේපල වල ලියා පදිංචි කරන ලද කළමනාකරණ සංස්ථා සංඛ්‍යාව 36 ක් පමණක් වී තිබුණි.තවද, පනතේ 5 (ඌ) වගන්තියට අනුව සහාධිපත්‍ය දේපලේ පොදු පහසුකම් නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතනයක් වෙත පැවරීමට කටයුතු කර නොතිබූ අතර 5 (O) වගන්තිය ප්‍රකාරව සහාධිපත්‍ය දේපළ නැවත සංවර්ධනය කිරීමේ වැඩසටහන්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

ආ) කළමනාකරණ සංස්ථා ලියාපදිංචි සංඛ්‍යාව 130 ක් වුවද, වර්ෂය තුලදී පිහිටුවා ඇති කමිටු සංඛ්‍යාව 15 ක් පමණක් වුයෙන් කළමනාකරණ සංස්ථා වලට අදාලව කළමනාකරණ කමිටු පිහිටුවීමේ ප්‍රගතිය ඉතා මන්දගාමී බව නිරීක්ෂණය විය.

ඇ) සමාලෝචිත වසර තුලදී සිය ඉලක්ක ප්‍රමාණවත් පරිදි ඉටු කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. විස්තර පහත සඳහන් පරිදි වේ.

| විෂය | ඉලක්ක ගත | | කාර්‍යය සාධන | ක්‍රියාකාර සැලැස්ම අනුව ප්‍රගතිය |
|---|---|---|---|---|
| | සංයුක්ත සැලැස්ම අනුව | ක්‍රියාකාර සැලැස්ම අනුව | සත්‍ය | ප්‍රතිශතය |
| - කළමනාකරණ සංස්ථා පිහිටුවීම ලියාපදිංචිය | 290 | 260 | 130 | 50% |
| - කළමනාකරණ සංස්ථා ලියාපදිංචි අළුත් කිරීම | - | 30 | 15 | 50% |
| - සහාධිපත්‍ය නියාම සමතකරණ හා මෙහෙයුම් කටයුතු | 200 | 180 | 67 | 37% |
| - සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම | 90 | 89 | 66 | 74% |

2.2.2 <u>සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම</u>

සංයුක්ත සැලැස්මේ ඉලක්ක හා ක්‍රියාකාර සැලැස්මේ ඉලක්ක අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් සංයුක්ත සැලැස්මේ ඇති ඉලක්කයන් ලගාකර ගැනීම සඳහා වු කෙටි කාලීන සැලැස්මක් ලෙස ක්‍රියාකාර සැලැස්ම උපයෝගී කරගෙන ඇති බවට විගණනයේදී සෑහිමකට පත්විය නොහැකි විය. ඉලක්කයන් ඉටුකර ගැනීමේ තත්ත්වයන් කාලීනව සමාලෝචනය කිරීමේ ඵලදායි ක්‍රමවේදයක් ආයතනය තුල නොතිබුණි මේ අනුව ඉලක්ක ඉටු කර ගැනීමේ ප්‍රගතිය කාලීනව සමාලොචනය කර දුර්වලතාවයන් හඳුනා ගෙන ඊට නිසි පිළියම් යෙදීමට ඇති හැකියාව කෙරෙහි කළමනාකරණය නිසි අවධානය යොමුකර නොතිබුණි. මෙම

තත්ත්වය ආයතනයේ දුර්වල මූල්‍ය තත්ත්වය සහ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සෘජුවම බලපා තිබුණි.

2.2.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

2006 අංක 38 දරන බදු පනතේ iii (අ) වගන්තියට අනුව අධිකාර්ය සිය කාර්‍ය්‍ය මණ්ඩලය සඳහා සමාලෝචිත වසරට අදාලව රු 92,825 ක උපයන විට බදු නිළධාරින්ගෙන් අයකරනු වෙනුවට අධිකාර්ය විසින් ගෙවා තිබුණි.

2.2.4 කොන්ත්‍රාත් පරිපාලනය

කොන්ත්‍රාත් සඳහා ලංසු කැඳවීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (අ) ජේදයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර අධිකාර්ය විසින් රු 7,763,910 ක් වූ කොන්ත්‍රාත් 37 ක් වෙනුවෙන් එකම කොන්ත්‍රාත්කරුවන් පිරිසකට ලිපි යැවීම මගින් ලංසු කැඳවීම් සිදුකර තිබුණි.ප්‍රසම්පාදන කාර්යය ප්‍රසිද්ධියට පත් නොකිරීම නිසා සෑම කොන්ත්‍රාතුවක් වෙනුවෙන්ම එක ලංසු කරුවෙක් පමණක් ඉදිරිපත් වී තිබුණු අතර නිතරගයෙන් එම කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාතු පිරිනමා තිබුණි.

3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

අ) කොන්ත්‍රාත් පරිපාලනය

ආ) සභාධිපත්‍ය සහතික නිකුත් කිරීම

ඇ) අතිකාල දීමනා ගෙවීම

ඉ) අත්තිකාරම් ගෙවීම

ඊ) කුවිතාන්සි පොත් පවත්වා ගැනීම